
## තාරුණ්‍යයේ සිත්තම්කරුවා

# ජනක රත්නායක





ඩවසම් තරුණයෙකුගේ දෑතින් එසැවී, දෑතට සිරවී ප්‍රීති ප්‍රමෝදයෙන් ඉපිළ ගිය සුන්දර යුවතියකි. ඇයගේ තියඹු ලතාවන් මඳ මඳ සුළඟේ සැලෙමින්, ලෙලෙමින් හාත්පස පතුරවන්නේ යෞවන ප්‍රේමයේ ආශ්වාදයම මිස අන්කවරක්ද ? ඒ සුන්දරත්වයෙන් මුසපත් යෞවනයා සිය පෙම්බරියගේ දෑසට එබී සිටින්නේ ඇගේ දෑසින් ලෝකයම දකින්නාක් මෙන්ය. ඔවුන්ගේ මේ ප්‍රේමාලිංගනය මා නෙතු ගැටුනේ අහම්බෙනි. ඉදිරි දිනෙක ඔබේත් මගේත් දෑස් අභිමුව සජීවී වන්නට සූදානමින් ඔවුන් ඒ වන විට සිටියේ දිවයින කාර්යාලයේ කුඩා මේසයක් මත වූ ධවල පත්‍රයකය. මෘදු හදවතිකින් හැසිරවෙන රළු සුරතක් පෙම් යුවල හැඩ ගන්වමින් සිටියේය. පින්සල් කීපයක්ද, වර්ණ සායම් කුප්පි කීපයක්ද මේසය මතට වී ඒ කටයුත්ත සඳහා සිත්තරාට නිහඬ සහයකය. සිය දැහැනෙන් මිදෙන තෙක් සිත්තරා අභිමුව නිසලව රැඳෙමින් මාද ඔහුට නිහඬ සහයක් පළකළෙමි. සිය කටයුත්තේ යම් අදියරක් අවසන් කළ හේ හිස ඔසවා මදෙස බැලීය. අපගේ සංලාපය ඇරඹෙන්නේ අනතුරුවය.

'මේක මේ රජීව් සෙබස්තියන්ගේ ඩී.වී.ඩී. එකකට කවරයක්. සුසිමා කියල චිත්‍රපටියක. අද හවසට එනවා කිව්වා ගෙනියන්න.'

හෙතෙම පැවසුවේ මෙතෙක් වේලා හැඩගන්වමින් සිටි පෙම් යුවල මේසයේ පසෙකට කරමිනි. අද අපගේ කතානායකයා ජනක රත්නායකය. වෘත්තීය සිත්තරෙකු වන හේ මේ වන විට සිය වෘත්තීය ජීවිතයේ හතලිස් පස්වැනි සැතපුම් කණුවද පසුකර හමාරය.



'ඉස්කෝලේ පළවෙනි පන්තියේ ඉගෙන ගන්න කොට මට මතකයි දවසක් අපේ ටීචර් අපිව පන්තියෙන් එළියට අරගෙන ඉස්කෝලේ වටේටම රවුමක් එක්ක ගෙන ගියා. ඒ යන ගමන් අපිට කිව්වා දැන් ඕගොල්ලෝ දකින හැම දෙයක්ම හොදට හිතේ තියාගන්න කියලා. ආපහු පන්තියට ඇවිල්ලා අපිට කිව්වා තමන් දැක්ක දෙයක් චිත්‍රයක් අඳින්න, ලස්සනම චිත්‍රය පන්තියේ බිත්තියේ අලවනවා කියලා. මම ඇන්දේ ඉස්කෝලේ පිට්ටනිය. කොලපාටට ඈත පේන පිට්ටනිය, පිට්ටනිය කෙළවරේ තිබුණ විශාල මාර ගස් පේලිය, කළුපාට දාර වැටුණ ඒවායේ විශාල කදන් ඈතින් පෙනෙන නිල්පාට අහස. මේ දේවල් තදින්ම මගේ හිතේ ඇදිලා තිබුණා. මම ඒවා මට පුළුවන් විදිහට ඇන්දා. එදා පන්තියේ හොඳම චිත්‍රය විදිහට තේරුණේ මගේ චිත්‍රය. අවුරුද්දක් යනකම් ඒක පන්තියේ බිත්තියේ අලවලා තිබුණා.'

සිත්තර ජීවිතයට අඩිතාලම වැටුණු ආකාරය ජනක සිහිපත් කරන්නේ එලෙසිනි. එදා බිත්තියේ අලවන ලද සිය සිතුවම දකින දකින වාරයක් පාසා චිත්‍ර ඇඳීමට තමන් තුළ පෙළඹවීමක් ඇති කළ බව හෙතෙම පවසයි. එමගින් දියුණු වූ සිය සිත්තර කුසලතාව හේතුවෙන් පසු කාලයේ පාසලේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් චිත්‍ර ඇඳීමට තෝරාගන්නා සිසුවා බවට පත්වන ජනක සිය වෘත්තීය ලෙස චිත්‍ර ශිල්පය තෝරාගන්නේ එහි එක් සන්ධිස්ථානයකදීය.

'ආනන්ද නාලන්ද බිග් මැච් එක වෙනුවෙන් ක්‍රිකට් කාටුන් අඳින්න මට පැවරෙන කොට මට මතක හැටියට මම සාමාන්‍ය පෙළ පන්තියේ හිටියේ. මේ කාටුන් ඩේලි මිරර් පත්තරේත් පළවුණා. දවසක් අහම්බෙන් මගේ මේ කටුන් දැකපු ටිකිරි ළමා පත්තරේ කර්තෘ මහත්තයා මට කතාකරලා කිව්වා පත්තරේට චිත්‍රකතා පිටුවක් කරන්න කියලා. ඒ වෙනුවෙන් මට ගෙවීමකුත් කළා. ඒක අවුරුද්දක් විතර කරගෙන යනකොට ඒ පත්තරේ චිත්‍ර ශිල්පියෙක් විදිහට රස්සාවක් දෙන්න මට කතාකළා. මට ඒකට ලොකු ආසාවක් ඇතිවුණාත් ගෙදරින් අනුමැතියක් ලැබුණේ නෑ. මගේ තාත්තා ඒ දවස්වල කොළඹ නගර සභාවේ සහකාර භාණ්ඩාගාරික විදිහට රස්සාව කළේ. හොඳ වැටුපක් ලැබුවා. තත්ත්වයක් තිබුණා. ඉතිං තාත්තට මගේ අදහස කිව්වාම තාත්තා මගෙන් ඇහුවා ඕකත් රස්සාවක්ද කියලා. අම්ම නම් ලොකු විරුද්ධත්වයක් දැක්වුවේ නෑ. කොහොම හරි අන්තිමේදී මම ගෙදරට හොරෙන් දවස ආයතනයේ වැඩට ගියා. ඉස්කෝලේ යන විදිහට ගෙදරින් ගිහිල්ලා එහේ වැඩට යනවා.'

එලෙස ඇරඹි සිය වෘත්තීය ජීවිතය පියවරෙන් පියවර සාර්ථක ලෙස ඉදිරියට ගමන් කළ ආකාරය ජනක අදටත් සිහිපත් කරන්නේ මහත් සොම්නසිනි. දවස කාර්යාලයෙන් හෙතෙම සමුගන්නේ ලේක්හවුස් ආයතනයෙන් ලද ආරාධනාවක් හේතුවෙනි. හැත්තෑව දශකයේ යම් දිනෙක ඔහුට ඒ ආරාධනාව කෙරුණේ ලේක්හවුස් ආයතනයෙන් ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කර ඇති 'සතුට' නමැති චිත්‍රකතා පත්‍රයට චිත්‍ර ශිල්පියෙකු ලෙස සම්බන්ධ වන ලෙසටය. ජනක ඇරියුම පිළිගත්තේය.

සටහන සහ ඡායා:
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

'ලංකාවේ මුල්ම චිත්‍රකතා පත්තරේ තමයි සතුට. මම ඒකට චිත්‍රකතා දෙකක් ඇන්දා. ඒ දෙකම බොහොම ජනප්‍රිය වුණා. බන්දුල හරිස්චන්ද්‍ර, දයා රාජපක්ෂ වගේ අය මගේ සම කාලීනයෝ. අපි එකට වැඩකළේ. මේ පත්තරේට හොඳ වෙළඳපොළක් ඇතිවුණා. ඒ කාලේ අද වගේ රූපවාහිනී, ගුවන් විදුලි නාලිකා වගේ දේවල්වත් තිබුණේ නෑ. චිත්‍රකතා පොත්, පත්තර තමයි ඒ වෙනුවට තිබුණේ.'

උපාලි පුවත්පත් සමාගමේ පුරෝගාමී පත්තරය ලෙස 'චිත්‍රමිත්‍ර' චිත්‍රකතා පත්‍රය ආරම්භ කරන්නේ චිත්‍රකතා කලාව විසින් සමාජය ආක්‍රමණය කරමින් තිබුණු කාලයේය. ඒ අසූව දශකයේ මුල් කාලයයි. ජනක ඇතුළුව සතුට පත්‍රයේ සේවය කරමින් සිටි ප්‍රමුඛ චිත්‍ර ශිල්පීන් සියළු දෙනාටම චිත්‍රමිත්‍ර කර්තෘ මණ්ඩලයට සම්බන්ධ වන ලෙස ඇරියුම් ලැබිණ.

'උපාලි විජේවර්ධන මහත්තයා ඔය ගැන කතා කරන වෙලාවේ කිව්වා මට පුවත්පත් ආයතනයක් පටන් ගන්න අවශ්‍යයයි. ඒකට පසුබිම හදාගන්න මේ වෙලාවේ හොඳම ක්‍රමය චිත්‍රකතා පත්තරයක් පටන්ගන්න එක. ඒකයි මේ කරන්නේ කියලා. උපාලි පුවත්පත් ආයතනයේ පළවෙනි සේවකයා මම. දැන් මම චිත්‍ර සංස්කාරකවරයා විදිහටයි වැඩකරන්නේ.'

රැකියාවක් සොයමින් පුද්ගලයන් පසුපස යාමට සිදුනොවී, වැඩි වරප්‍රසාද සහිත රැකියා තමන් පසුපස හඹා ඒම වෘත්තීය චිත්‍ර ශිල්පියෙකු ලෙස ජනක ලද පූර්ව වාසනා මහිමයක් සේ සැළකිය හැකිය. එහෙත් පොදුවේ ගත්කළ සිත්තරුන්ගේ ඉරණම මීට වඩා වෙනස් නොවන්නේද ?

'මම කියන්නේ ඕනෑම කෙනෙකුට තමන්ගේ හැකියාවන් වර්ධනය කරගත්තොත් චිත්‍ර ශිල්පියෙක් විදිහට වෘත්තීය ජීවිතයක් ගොඩනගා ගන්න අපහසුවක් නෑ. හොඳ ආදායමක් ලබාගන්නත් පුළුවන්. හැබැයි එතනට එන්න කැපවීමක් කරන්න ඕනේ. මහන්සි වෙන්න ඕනේ. අපි දන්න දෙයක් තමයි හැම ගෙදරකම චිත්‍ර අඳින්න දක්ෂ එක්කෙනෙක්වත් ඉන්නවා. ඒ අතර එක්කෙනෙක් නොවී ඒ වගේ අය සීයක් අතරින් ප්‍රමුඛයෙක් වෙන්න කාට හරි පුළුවන් නම් අන්න ඒ කෙනාට තමයි වෘත්තීය චිත්‍ර ශිල්පියෙක් විදිහට ගමනක් යන්න පුළුවන් වෙන්නේ. ඒ වගේම පුද්ගලයෙක් විදිහට වර්ධනය කරගත යුතු තවත් දේවල් තියනවා. නිහතමානි බව ඉවසීම වගේ ගුණාංග පුරුදු කරන්න ඕනේ. එහෙම වැඩකරලා තමන්ගේ ශෛලියක් ගොඩනගා ගත්තම අදටත් චිත්‍ර ශිල්පියෙකුට ඕනේ තරම් අවස්ථා තියනවා සාර්ථක වෘත්තීය ජීවිතයකට. මම බැන්දේ උපාලි ආයතනයේම රැකියාව කළ කෙනෙක්. ආයතනයේ නීතිවල හැටියට බැන්දට පස්සේ එයාට රස්සාවෙන් අයින් වෙන්න වුණා. ඒත් මට පුළුවන් වුණා බැංකු ණයක් නොගෙන ගෙයක් හදාගන්න. දරුවන්ගේ වැඩකටයුතු වෙනුවෙන් වෙනම වාහනයක් අරන් දෙන්න. ඒ හැම දෙයක්ම කළේ චිත්‍ර ශිල්පියෙක් විදිහට මම ලබපු ආදායමෙන්.'

පසු කාලයක චිත්‍රකතා පත්තර කලාව අභාවයට යාමෙන් ඒවායේ රැකියා කළ ඇතැම් චිත්‍ර ශිල්පීන් කෙටි කාලීනව යම් යම් දුෂ්කරතාවයන්ට මුහුණ පෑවද දක්ෂයන්ට ගැටළුවක් ඇති නොවූ බව ජනක පවසයි.

'අද සුපර්ස්ටාර්ල වගේ තමයි ඒ කාලේ චිත්‍රකතා ශිල්පීන්. පුදුම විදිහේ ජනප්‍රියත්වයක් තිබුණේ. චිත්‍රමිත්‍ර කරන කාලේ මට මාසෙකට රසිකයන්ගෙන් ලියුම් තුන්දාහක් විතර මට එනවා. වෙනත් පත්තර වලින් දෙගුනයක් ගෙවන්නම් කියලා රස්සා දෙන්න කතා කරනවා. ඒත් පස්සෙ පස්සේ විවිධ පුද්ගලයන් චිත්‍රකතා පත්තර පටන් ගත්තට පස්සේ ටිකෙන් ටික ඒවායේ ගුණාත්මක බව පිරිහෙන්න පටන්ගත්තා. චිත්‍රකතා පත්තර ගෙදරකට නොගත යුතු දෙයක් විදිහට සළකන තත්ත්වයක් ඇතිවුණා. දවසක් මම වෙනත් චිත්‍රකතා පත්තරයක් ළමයින්ට බලන්න කියලා ගෙදර අරන් ගිය වෙලාවක මට මතකයි බිරිඳ ඇහුවා ඇයි මේක ගෙදර ගෙනාවේ කියලා. පස්සේ මම පත්තරේ පෙරළලා බැලුවම මටත් තේරුණා ඒක ළමයි ඉන්න ගෙදරකට ගෙනියන්න සුදුසු නැති තත්ත්වයේ එකක් කියලා.'



ජනක පවසන ආකාරයට මුල් යුගයේ චිත්‍රකතා ශිල්පීන් වෘත්තීය ප්‍රතිපත්ති ගොඩනගාගෙන ඒ මත පිහිටා කටයුතු කර තිබේ.

33 පිටට

